# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන හායනය කෙරෙහි බලපාන පාරිසරික හා මානුෂීය ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යයනයක්

සී.එම්.ආර්.වී. බණ්ඩාර, ජේ.ජී.මධුෂාන්*

ඈත දිගු අතීතයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන රැසක් පිහිටි රටකි. මෙම පුරාවිද්‍යාත්මක උරුමයන් ශ්‍රී ලංකාවේ පෞඪ අතීතය පිළිබඳව ලොවට කියාපායි. රටේ සමස්ත භූමි ප්‍රදේශය තුළම අඩු වැඩි වශයෙන් පුරාවිද්‍යාත්මක උරුමයන් ව්‍යාප්තව ඇත. එම උරුමයන් අතරින් බොහොමයක් ස්ථාන ගවේෂණය කර හඳුනා ගැනීමට ද මේ වනවිට හැකි වී ඇත.

නමුත් මෙම පුරාවිද්‍යාත්මක ස්ථාන, ගොඩනැගිලි, නටඹුන්, සිතුවම් හා වාරි කර්මාන්ත ආදියෙහි ඉදිරි පැවැත්ම කෙරෙහි වර්තමානයේ එල්ල වී ඇත්තේ බරපතල අභියෝගයකි. විශේෂයෙන් ම මානුෂ ක්‍රියාකාරකම් හා විවිධ පාරිසරික බලපෑම් මත පුරාවිද්‍යාත්මක උරුමයන් විනාශ වී යාම සිදු වේ. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය සංවර්ධන යෝජනා ක්‍රම, වෙළඳ හා වාණිජ කටයුතු, කාලගුණික හා දේශගුණික වෙනස්වීම් වල බලපෑම, ආදියෙන් පුරාවිද්‍යාත්මක උරුමයන්ට එල්ල වන ඍජු හා වක්‍ර බලපෑම් තුළින් ඒවායෙහි ඉදිරි පැවැත්ම හා ඒවායෙහි පවතින වටිනාකම විනාශ වී යාම සිදු වේ. මෙම අධ්‍යනය තුළින් වර්තමානය වනවිට පුරාවිද්‍යා උරුමයන්හි ඉදිරි පැවැත්මට එල්ල වී ඇති අභියෝග පිළිබඳව විමර්ශනය කිරීමත් ඒවා අවම කරගැනීමට හා වැළක්වීමට ගත හැකි පියවර පිළිබඳව යෝජනා හා මත ඉදිරිපත් කිරීමත් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී තෝරාගත් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත භූමි ප්‍රදේශ කිහිපයක් ගවේෂණය කිරීම ඇසුරින්, සම්මුඛ සාකච්ඡා තුළින් හා තෝරාගත් ද්විතියික මූලාශ්‍රය පරිහරණය කිරීම යන ක්‍රමවේද තුළින් අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කරගෙන ඇත. මෙහිදී තෝරාගත් පුරාවිද්‍යා උරුම හතරක් ආශ්‍රිතව ගවේෂණය කිරීමට අපේක්ෂිත අතර ඒ තුළින් දැනට පුරාවිද්‍යා නටඹුන්, සිතුවම් හා භූමියට එල්ල වී ඇති බලපෑම් පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කොට එම හායනයන් හා විනාශයන් වළක්වාලීමට හා අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමට මෙයින් අපේක්ෂිත ය.

මුඛ්‍ය පද :- පුරාවිද්‍යාව, පුරාවිද්‍යා උරුමය, පුරාවස්තු හායනය, පුරාවිද්‍යා සංරක්ෂණය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය Rumalvindula1995@gmail.com